# නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
## சட்டம் மற்றும் ஒழுங்கு அமைச்சு
## Ministry of Law & Order

මගේ අංකය / எனது இலக்கம் / My No
ඔබේ අංකය / உமது இலக்கம் / Your No
දිනය / திகதி / Date

# මාධ්‍ය නිවේදනය

**විවිධ වර්ගයේ නීති විරෝධී ආවේක්ෂණය සහ හිරිහැරවලට ලක්වීම පිළිබඳව පැමිණිලි කිරීම සඳහා මහජනතාවට ඇති විවිධ යාන්ත්‍රණ**

මානව හිමිකම් ක්‍රියාකාරීන් ඇතුළුව මහජනයාට සිදුවන විවිධ හිරිහැර හා නීති විරෝධී කටයුතු සහ මානව අයිතිවාසිකම් උල්ලංඝණයවීම් වලට ගොදුරු වූ අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන් පිළිබඳව නීතිය හා සාමය අමාත්‍යාංශය විසින් කලින් කලට මහජනයා දැනුවත් කිරීම සිදුකෙරේ.

රටේ සියලුම පුරවැසියන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය තහවුරු කිරීමට ශ්‍රී ලංකාවේ රජය නිරන්තරයෙන් බැඳීසිටින අතර කිසියම් හෝ ආකාරයකින් මහජනතාවට එරෙහිව සිදුකරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය දැනුවත් කිරීමෙන් අනතුරුව පවතින නීති රාමුව තුළ හැකි උපරිම ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

එබැවින්, කිසියම් හෝ පුද්ගලයෙකු බියවැද්දීමකට ලක්කිරීමක් හෝ එවැනි බියවැද්දීමකට ලක්වූ බව දැනුවත් වූයේනම්, කිසියම් හෝ පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් විසින් හිරිහැරයට ලක්වූයේනම් පහත සඳහන් එක් යාන්ත්‍රණයක් හෝ සියල්ල හෝ ඔස්සේ පැමිණිලි කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වනු ලැබේ.

- ජාතික පොලිස් කොමිසම - 1960 (ක්ෂණික ඇමතුම්), 0115 107 722
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම - 1996 (ක්ෂණික ඇමතුම්), 0112 505 575
- ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ පරීක්ෂණ ඒකකය - 119 (ක්ෂණික ඇමතුම්)
- පොලිස්පතිට කියන්න - මාර්ගගත පැමිණිලි සඳහා - www.telligp.police.lk

**නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය**

2018.03.16

14 වන මහල, 'සුහුරුපාය', ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
14 வது மாடி, 'சுஹுருபாய', ஸ்ரீ சுபூதிபுர வீதி, பத்தரமுல்ல, இலங்கை
14th Floor, 'Suhurupaya', Sri Subhuthipura Road, Battaramulla, Sri Lanka.
දුරකථන / தொலைபேசி / Telephone: +94 112 887485, +94 112 886067, +94 112 887268, +94 112 887307
ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 112 887216
ඊ මේල් / மின்னஞ்சல் / E-Mail: secretary@lawandorder.lk, secretarymlsd@gmail.com